NILIS

s

# පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Library and Information Management (පාඨමාලා කේතය: DLIM)

DLIM 2024/2025

### 1) හැඳින්වීම

වත්මන් තොරතුරු සමාජය තුළ තොරතුරු මනාව කළමණාකරණය කිරීමට පවත්නා හැකියාව ඕනෑම පුද්ගලයෙකුගේ අධ්‍යාපනික, වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා වන තීරණාත්මක සාධකයක් වේ. මෙම කාර්යය සඳහා විධිමත් සහ කාර්යක්ෂම පුස්තකාල හා තොරතුරු සේවාවක් පැවැත්ම අත්‍යවශ්‍ය කොන්දේසියක් වන අතර, මෙහිදී පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන්නන්ට පැවරෙන භූමිකාව සුවිශේෂිය. ඔවුන් තොරතුරු යුගයේ අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් තම දැනුම කුසලතා සහ ආකල්ප වර්ධනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. දැනට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන සහ එම ක්ෂේත්‍රයට ඉදිරියේදී පිවිසීමට අපේක්ෂා කරන අය තොරතුරු යුගයට ගැලපෙන වෘත්තිකයන් බවට පත් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට සුදුසු අයුරින් මෙම පාඨමාලාව සැලසුම් කර තිබේ.

### 2) ඉලක්ක කණ්ඩායම

පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සේවය කරන හෝ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයකු සඳහා

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

- අ.පො.ස (උ.පෙ.) සමත්වීම (පැරණි විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 04 සමත් වීම හෝ නව විෂය නිර්දේශයට අනුව ප්‍රධාන විෂයන් 03 සමත්වීම.)

  **හෝ**
- අ.පො.ස (සා.පෙ.) සමත්වීම <u>සහ</u> ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන **මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) / මහජන පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACPL) / පාසල් පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව (ACSL) / හෝ පුස්තකාලයාධිපතිත්ව උසස් සහතික පත්‍ර පාඨමාලාව** (ACL) සමත්ව තිබීම.

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු පාඨමාලාලාභීන්ට

- සංවිධානයක තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීමට
- විවිධ සම්පත්වලින් තොරතුරු කාර්යක්ෂමව ගවේෂණය කිරීමට
- පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයක ලේඛන මනාව කළමනාකරණය කිරීමට
- ඉලෙක්ට්‍රොනික පරිසරයක් තුළ පරිගණක කාර්යක්ෂමව භාවිත කිරීමට

හැකියාව ලැබෙනු ඇත.

### 5) පාඨමාලාවට අන්තර්ගත විෂයන්

1. පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ හැඳින්වීම
2. එකතු සංවර්ධනය සහ කළමනාකරණය
3. පුස්තකාල සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය
4. තොරතුරු සම්පත් හා සේවා
5. ව්‍යාපෘති වාර්තා සම්පාදනය
6. ලේඛන කළමනාකරණය
7. ප්‍රජා තොරතුරු කළමනාකරණය
8. තොරතුරු නිෂ්පාදන සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම

**6. වැඩසටහනේ වැදගත්කම:** DLIM පාඨමාලාව (ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ - SLQF Level 3) සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූපයේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන පුස්තකාල හා තොරතුරු කළමණාකරණ උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.




**7. පාඨමාලා කාලය :** මාස 12

8. **මාධ්‍ය :** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

**9. පන්ති පැවැත්වීම :** දේශන වැඩි ප්‍රමාණයක් මාර්ගගතව පැවැත්වේ.

10. **ඇගයීම් ක්‍රමවේදය :** පැවරුම්, අධ්‍යයන වාරයේ අවසානයේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය

11. සහ ව්‍යාපෘති වාර්තාවක් මගින් සිසුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ.

12. **පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම්.** පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට නම් සෑම විෂයයකට අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

**13. පාඨමාලා ගාස්තුව : සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 29000/= කි.** (වාරික දෙකකින් ගෙවිය හැක)

**14. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය :** 2024 ජනවාරි 06

**15. වැඩසටහන් ආරම්භය:** 2024 පෙබරවාරි මස

**16. අයදුම් කරන ආකාරය**

1. අයදුම්පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් **(www.nilis.cmb.ac.lk)** බාගත කරන්න.
2. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න
3. අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 300.00 ක මුදලක් මහජන බැංකුව තිඹිරිගස්යාය ශාඛාවේ **086100101191736** අංක දරණ ගිණුමට බැර කර මුල් ලදුපත අයදුම් පත්‍රයේ ලබා දී ඇති කොටුවේ අලවන්න.
4. ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, සහ අ.පො.ස./උ.පෙළ සහතිකයේ මුල් පිටපත් සහ ඒවායේ ඡායා පිටපත් එක බැගින් ඡායා පිටපත් කට්ටලයක්.
5. ඉහත සඳහන් අයදුම්පත්‍රය සහ සියලුම සහතිකවල මුල් පිටපත් සමඟ 2024 ජනවාරි 6 වැනි දින පෙ.ව. 9.30ට NILIS වෙත පැමිණෙන්න

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03

විමසීම : 011 2507150 / 071 4434638